WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය	I, II
தொடர்பாடலும் ஊடகக்கற்கையும்	I, II
Communication and Media Studies	I, II

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

1. තොරතුරු හුවමාරුව සන්නිවේදන ක්‍රියාවලියේ මූලික කාර්යයයි.

(i) මිනිසාට තොරතුරු වැදගත් වන ප්‍රධාන අවස්ථා **දෙකක්** නම් කරන්න.

(ii) තොරතුරු මගින් ඉටු කෙරෙන සමාජ අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ පුරාතන යුගයෙහි තොරතුරු ලබා දීම සඳහා භාවිත කළ විධික්‍රම **දෙකක්** ලියන්න.

(iv) තොරතුරු රැස් කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** නම් කරන්න.

(v) ප්‍රධාන සන්නිවේදන වර්ග **දෙකක්** ලියන්න.

(vi) තොරතුරු සම්ප්‍රේෂණ මෙවලමක් වන ගුවන්විදුලියේ නිර්මාතෘවරයා කවුද?

(vii) සන්නිවේදනය පිළිබඳ ෂැනන් සහ වීවර් ගේ නිර්වචනය ලියන්න.

(viii) විධිමත් සන්නිවේදනයේ දී දැකිය හැකි සන්නිවේදන ආකෘති **දෙකක්** සඳහන් කරන්න.

(ix) නූතන තොරතුරු සන්නිවේදනයේ දී වැදගත් වන පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

(x) නිර්මාණාත්මක සන්නිවේදනයෙහි ලා භාවිත සිනමා මාධ්‍ය හා සම්බන්ධ 'දෘෂ්ටියේ අබණ්ඩතාව' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

2. පාසල් වර්ණ ප්‍රදානෝත්සවයේ නිවේදන කටයුතු සඳහා රවී සහ කමලාගේ නම් යෝජනා විය.

(i) මෙම උත්සවයට පෙර රවී හා කමලා ඒ පිළිබඳව වාචික සන්නිවේදනයේ යෙදේ. වාචික සන්නිවේදනය යනු කුමක් ද?

WWW.OLEVELAPI.COM

(ii) වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා අවධානය යොමු කළ යුතු භාෂාව සම්බන්ධ අංග **දෙකක්** පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(iii) සමූහ සන්නිවේදනයේ විශේෂතා **තුනක්** ඉහත උත්සව අවස්ථාව ඇසුරෙන් විස්තර කරන්න.

(iv) මෙම උත්සවය පටිගත කළ වැඩසටහනක් ලෙස ගුවන්විදුලි මාධ්‍ය තුළ ප්‍රචාරය විය. ගුවන්විදුලි මාධ්‍යයේ ලක්ෂණ **හතරක්** විස්තර කරන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

3. විවිධ මාධ්‍ය මඟින් සිදු කරන තොරතුරු විසරණ ක්‍රියාවලිය සංකීර්ණ වූවකි.

(i) බහුල ලෙස යොදා ගනු ලබන තොරතුරු වාර්තාකරණ ක්‍රම **දෙක** නම් කරන්න.

(ii) පුවත්පත් වාර්තාකරණයේ දී 'පෙළ' සහ 'රූපය' යන්නට අයත් වන අංග **දෙක** බැගින් වෙන වෙන ම සඳහන් කරන්න.

(iii) ගුවන්විදුලි පිටපත් රචනයේ දී සැලකිලිමත් වන පහත සාධකවල සුවිශේෂතා වෙන වෙන ම පැහැදිලි කරන්න.

(අ) භාෂාවේ ස්වරූපය (ආ) ආමන්ත්‍රණ ස්වරූපය

(ඉ) ශ්‍රවණ ස්වරූපය

(iv) මාධ්‍ය මඟින් ඉදිරිපත් කෙරෙන තොරතුරු හේතු කොටගෙන සමාජයට එල්ලවන පහත බලපෑම් **හතර** පිළිබඳව අදහස් දක්වන්න.

(අ) සාම්ප්‍රදායික භාෂාව වෙනස් වීම (ආ) අවර ගණයේ රසවින්දනයට හුරු වීම

(ඉ) ප්‍රචණ්ඩකාරී සිදුවීම් නිතර ඉදිරිපත් වීම (ඊ) නිෂ්ඵල හුරු පුරුදුවලට යොමු වීම

4. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය ව්‍යාප්තිය රටක ජනමාධ්‍ය භාවිතයට තීරණාත්මක බලපෑමක් සිදු කර ඇත.

(i) කිසියම් රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යවලින් නව මාධ්‍ය වෙනස්වීමට බලපාන ලක්ෂණය කුමක් ද?

(ii) ග්‍රාහක වර්ගීකරණයට අනුව ප්‍රධාන ග්‍රාහක වර්ග **දෙක** නම් කරන්න.

(iii) අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අන්තර්ජාලය වැදගත් වන ආකාරය කරුණු **තුනකින්** පැහැදිලි කරන්න.

(iv) සමාජ මාධ්‍ය භාවිතයේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම **දෙකක්** විස්තර කරන්න.

5. සන්දේශ නිර්මාණශීලීව සකස් කිරීම ග්‍රාහක ආකර්ෂණයට හේතු වේ.

(i) නිර්මාණයක පවත්නා ගුණාංග **දෙකක්** ලියන්න.

(ii) පුවත්පත් මාධ්‍යය තුළ නිශ්චල ඡායාරූප භාවිතයේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යය තුළ නිර්මාණශීලීව ඉදිරිපත් කළ හැකි වැඩසටහන් ආකෘති **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී යොදා ගන්නා පහත ප්‍රකාශන විධි පිළිබඳ උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

(අ) භාෂාත්මක ප්‍රකාශන විධි (ආ) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

(ඉ) දෘශ්‍ය ප්‍රකාශන විධි (ඊ) ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි

6. රාජිනීගේ ව්‍යාපාරික ආයතනයට නව කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමට තීරණය කෙරිණි. ඒ සඳහා අවශ්‍ය විවිධ උපකරණ පිළිබඳ කළමනාකරුවන් අතර සාකච්ඡාවක් පැවැතිවිණි.

WWW.OLEVELAPI.COM

(i) කාර්යාලයට අවශ්‍ය ප්‍රධාන දුරකථන වර්ග **දෙක** නම් කරන්න.

(ii) කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියට පාදක වන කාර්යන් **හතර** නම් කරන්න.

(iii) ව්‍යාපාරික ආයතනයට වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ආයතනයෙහි CCTV කැමරා සවි කිරීමේ ඇති වැදගත්කම උදාහරණ **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

7. රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය සමාජයට ප්‍රබල බලපෑමක් සිදුකරනු ලබයි.

(i) රජයට හිමි රූපවාහිනී ආයතනයක් නම් කරන්න.

(ii) පුවත්පතක ප්‍රවෘත්ති අංශය තුළ සිටින සංස්කාරකවරු දෙදෙනකුගේ නිල තනතුරු නාම **දෙකක්** දක්වන්න.

(iii) ජනමාධ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ පහත තේමා පිළිබඳ විස්තර කරන්න.

(අ) මාධ්‍ය හිමිකරු (ආ) මාධ්‍යවේදිය (ඉ) ග්‍රාහකයා

(iv) ජනමාධ්‍ය ක්ෂේත්‍රය සඳහා රජය මඟින් සිදු කරනු ලබන සෘජු මැදිහත්වීමක් සහ වක්‍ර මැදිහත්වීමක් පැහැදිලි කරන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...